# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,903 — 1970 අප්‍රේල් 24 වැනි සිකුරාද — 1970.4.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 553 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 564 | රට කීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 578 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| මඩු බාගිරාදිය විකිණීම ... ... ... | 578 | විවිධ දැන්වීම ... — ... .. | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙවුවත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිය යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

3. **බඳවා ගැනීමේ කොන්දේසි.**—(1) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

(2) මෙම පත්වීම ප්‍රථම කොට අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔහු/ඇ පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1970.5.8 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු බවට හා අවුරුදු 40 ට නොවැඩි බවට, (දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරු දරන අයට උපරිම වයස් සීමාව බල නොපානවා ඇත.

(ආ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක්, (1 වැනි හෝ 2 වැනි පංතියේ සම්මානයක් ලත් අයට වැඩි සැලකිලි දක්වනු ලැබේ.)

සහ

(ii) පුස්තකාල වැඩ සම්බන්ධයෙන් වූ පුස්තකාල විද්‍යාව/ පුස්තකාල කලාව පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම්,

නැතහොත්

එක්සත් රාජධානියේ පුස්තකාල සංගමය මගින් පවත්වන අවසාන පරීක්ෂණයේ හෝ ලංකා පුස්තකාල සංගමය මගින් පවත්වනු ලබන අවසාන පරීක්ෂණයෙන් සමත්ව සිටීම,

හා

(iii) විශ්ව විද්‍යාලයක අවුරුදු 5 ක හෝ කාර්මික විද්‍යාලයක සහ/හෝ ගුරු විද්‍යාලයක සහ/හෝ ද්විතීයික අධ්‍යාපන මට්ටමේ අවුරුදු 7 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද,

නැතහොත්

විශ්ව විද්‍යාලයක හෝ ඒ හා සමාන ආයතනයක පුස්තකාලයක පරිපාලනය පිළිබඳ ඇවුරුද්දක පුහුණුව.

**සංලක්ෂ්‍යය.**—ඉහත සඳහන් (iii) වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් නොසිටියහොත් (iii) වැනි ඡේදයේ සඳහන්ව ඇති කාල පරිච්ඡේදයට අඩු පළපුරුද්දක් ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ගැනද සලකා බලනු ලැබේ.

(ඇ) දෙහිවල, ගාල්ල, කෑගල්ල, පොල්ගොල්ල හා කුලියාපිටිය කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල තනතුරු සඳහා අයදුම්කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබීම අවශ්‍ය වේ. පලාලි කණිෂ්ඨ විශ්ව විද්‍යාලයේ තනතුරු සඳහා අයදුම්කරුවන්ට දෙමළෙන් වැඩ කිරීමට මනා දැනීමක් තිබීම අවශ්‍ය ය. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන කාල පරිච්ඡේදයක් තුළදී සිංහල හෝ දෙමළ (අදාල විය හැකි පරිදි) පිළිබඳ නියමිත තත්ත්වයක වැඩිපුර ප්‍රවීණතාවයක් ලබා ගන්නා ලෙස පත්වීම සඳහා තෝරා ගන්නා ලද ඕනෑම තැනැත්තෙකුගෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ට ඉල්ලා සිටිය හැකි ය.

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සනීපයෙන් යුක්තවීම.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවකදී අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—බෞතීස්ම සහතික හෝ උපකෘත පාසැල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නොලැබේ.)

(ආ) උපාධිය සහ උසස්ම අධ්‍යාපන සහතික.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන්, විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඉ) සිංහලෙන්/දෙමළෙන් සමත් වූ උසස්ම විභාගයේ සහතික පත්‍රය.

**සංලක්ෂ්‍යය.**—(1) අයදුම්පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නොඇමිණිය යුතුයි.

(2) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවා නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිද බලනු මැනවි.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට, ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම්පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් මස 17 වැනිදා,
තැ. පෙ. 500,
කොළඹ 1, ගාළු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

4-801/1—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 42/එක්ස්. 2232/70.

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ II වන ශ්‍රේණියේ ආයුර්වේද කථිකාචාර්ය තනතුරු

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ II වන ශ්‍රේණියේ ආයුර්වේද කථිකාචාර්ය (ආයුර්වේද අංශය) තනතුරු සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘතිපත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර—1970 මැයි මස 8 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම්පත්‍ර—1970 මැයි මස 15 වැනිදා.

සටහන් :

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට

ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි :—**

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රජයේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට අවසර දෙනු නොලැබේ.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරුවලට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය : රු. 6,780—360×12—11,040 කි. රුපියල් 9,600 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත. ආයුර්වේද පිළිබඳ මූලික පර්යේෂණ හෝ ආයුර්වේදය පිළිබඳ නොයෙකුත් නිබන්ධ පළ කිරීමෙන් ලත් විශිෂ්ඨ කීර්තිය හෝ පශ්චාත් උපාධි සුදුසුකම්වලින් යුතුව රු. 9,600 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

(බී) 1970 මැයි මස 8 දිනට අවුරුදු 25 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (උපරිම වයස් සීමාව දෙපාර්තමේන්තු නිලධාරීන්ට බල නොපායි.)

(සී) පිළිගත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයක පළමුවෙනි පන්තියේ ගෞරව ඩිප්ලෝමා සහතිකයක් හෝ 1965 ට ප්‍රථම ලබාගත් ගෞරව ඩිප්ලෝමා සහතිකයක් හෝ ආයුර්වේදය පිළිබඳ ලබාගත් පශ්චාත් උපාධියක්.

**සටහන.**—පිළිගත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයක දෙවෙනි පන්තියේ ගෞරව ඩිප්ලෝමා සහතිකයක් හෝ 1965 ට ප්‍රථම ලබාගත් පළමුවෙනි පන්තියේ ඩිප්ලෝමා සහතිකයක් දරන්නන්ටද මෙම තනතුරු සඳහා අයදුම් කළ හැකිය. එහෙත් ඔවුන්ගේ අයදුම්පත් සලකා බලනු ලබන්නේ ඉහත 4 (සී) ඡේදය අනුව සෑහෙන අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබුණහොත් පමණි.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂතැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ නමුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර ෆෝරමය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර ෆෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර ෆෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම්පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් මස 17 දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය,
තැ. පෙ. 500.

4–801/2—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඊඊ 37/එක්ස්. 2233/70.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### I වැනි ශ්‍රේණියේ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා කථිකාචාර්ය තනතුර හෝ එම තනතුරට පුහුණුවන්නකු තෝරා ගැනීම

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, අම්පාරේ "හාඩි" ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ I වැනි ශ්‍රේණියේ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා කථිකාචාර්ය තනතුර හෝ එම තනතුරට පුහුණුවන්නකු ලෙස පත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මඟින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 මැයි මස 8 වැනි දා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 මැයි මස 15 වැනි ද.

**සටහන :—**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නො වූ ද තම ලිපිනය ලියන ලද්ද වූ ද මුද්දර නො ගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලිපිමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නො වේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතු ය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයින්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි ය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරා ගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය. :—

වාර්ෂිකව රු. 11,520—10 × 480—16,320. (රු. 14,880 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක්)

**සැ. යු.**—මෙහි 5 වැනි ඡේදය යටතේ පුහුණුවන්නකු තෝරා ගත හොත් ඔහුට ගෙවිය යුතු වැටුප හෝ දීමනා භාණ්ඩාගාරයේ උපදෙස් අනුව තීරණය කරනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1970.5.8 වැනිදා තමන්ගේ වයස අවුරුදු 30 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතු ය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ඉ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබන ලද යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ බී.එස්.සී. (ඉංජිනේරු)
I වැනි හෝ
II වැනි පෙළ ගෞරව උපාධිය ;

සහ

(ii) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ එම්.එස්.සී. හෝ පී.එච්.ඩී. හෝ යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය ;

සහ

(iii) අවුරුදු 5 ක උපාධි මට්ටමේ ඉගැන්වීමේ පළපුරුද්ද සහ/හෝ රජයේ ආයතනයක හෝ සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වගකිවයුතු තනතුරක ප්‍රායෝගික පළපුරුද්ද ;

සහ

(ඊ) සිංහලෙන් ඉගැන්වීමට පුළුවන්වීම හෝ පත්වීමේ දින සිට අවුරුදු 3 ක කාලයක් ඇතුළතදී සිංහල භාෂාවේ ප්‍රවීණත්වයක් ලබා ගැනීම.

5. (i) **පුහුණුව සඳහා පිරිනැමෙන ශිෂ්‍යත්ව පිළිබඳ කොන්දේසි.**—4 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් ඇති කිසිවෙකුගෙන් ඉල්ලුම් පත්‍ර නො ලැබුණහොත් හෝ තනතුර සඳහා සුදුසු අයදුම්කරුවෙකු නොසිටිය හොත් පුහුණුවන්නකු පත් කර ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගේ ඉල්ලුම් පත්‍ර සැලකිල්ලට භාජනය කරනු ලැබේ.

(අ) වයස් සීමාවන් 1970.5.8 දිනට වයස අවුරුදු 28 ට නො අඩු අවුරුදු 40 ට නො වැඩි විය යුතු ය. (මෙම වයස් සීමාවන් සියලුම අයදුම්කරුවන්ට එකසේ බලපායි.)

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවෙන් I වැනි හෝ II වැනි පෙළ ගෞරව උපාධියක්.

සහ

(ඇ) අවුරුදු 5 ක උපාධි මට්ටමේ ඉගැන්වීමේ පළපුරුද්ද සහ/හෝ රජයේ ආයතනයක හෝ සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වගකිව යුතු තනතුරක ප්‍රායෝගික පළපුරුද්ද.

(ඈ) විශිෂ්ඨ චරිතයක් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවත් ය.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයාට පිටරට ගොස් පුහුණුවක් ලබන ලෙස නියම කරන්නට ඉඩ තිබේ. එසේ පුහුණුවන කාලය තුළ සුදුසු අන්දමේ දීමනාවක් ඔහුට ගෙවනු ලැබේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයා පිටරට ගොස් පුහුණුවක් ලැබිය යුතු යයි නියම කළහොත් ඔහු ලංකාණ්ඩුව සමග ගිවිසුමකට බැඳිය යුතු වන්නේ ය. එම ගිවිසුම යටතේ පොරොන්දු විය යුතු වෙනත් දේවල් අතර ඔහු පහත සඳහන් පොරොන්දුවලට ද බැඳිය යුතු වේ. එනම්,

(අ) නියමිත අභ්‍යාස පාඨමාලාව අවංක ලෙස සහ උත්සාහවන්තව හදාරා සතුටුදායක අන්දමින් නිම කිරීමට සහ එසේ නිම කිරීමෙන් පසු නියමිත කාල පරිච්ඡේදයක් තුළ ලංකාණ්ඩුවේ සේවය කළ යුතු යයි කියා සිටියහොත් (කාල පරිච්ඡේදය නියම කිරීම ලංකාණ්ඩුව විසින් කෙරෙනු ඇත.) එසේ සේවය කිරීමට ද,

(ආ) ගිවිසුමේ රෙගුලාසි සහ කොන්දේසි පිළිපැදීමට තමා අපොහොසත් වුවහොත් ලංකාණ්ඩුව විසින් සහ/හෝ ශිෂ්‍යත්ව ප්‍රදාන ඒජන්සිය විසින් පුහුණු කිරීමේ මූළ් කාර්යය වෙනුවෙන් කරන්නට යෙදුන සියලුම වියහියදම් (එනම්, වැටුප් දීමනා, යාන ගාස්තු සහ වෙනත් ගාස්තු ආදිය) ලංකාණ්ඩුවට ආපසු ගෙවීමට ද සිදුවෙයි.

(iv) තෝරා ගනු ලබන අපේක්ෂකයා යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා සම්බන්ධ පිළිගත් වෘත්තිය සුදුසුකම් හෝ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා සම්බන්ධ පශ්චාත් උපාධියක් ලබා ගත යුතුය.

6. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උප කෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාරගනු නො ලැබේ).

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඉ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයා ගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඊ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(උ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

7. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. එසේ වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සළකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

8. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

10. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතු ය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන් ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතු ය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් මස 17 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය,
තැ. පෙ. 500.

4–801/3—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

## ලංකා විදේශ දූත මණ්ඩලවල ඇබෑර්තු

### ලිපිකරු තනතුරු—සාමාන්‍ය ලිපිකරු සේවය

ලංකා විදේශ දූත මණ්ඩලවල ලිපිකරු තනතුරු සඳහා සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. කලින් විදේශ දූත මණ්ඩල එකකට වැඩි ගණනක සේවය කර ඇති අය ඉල්ලුම් කළ යුතු නැත.

3. අවිවාහක නිලධාරීන්ගේ හෝ කුඩා පවුල් ඇති විවාහක නිලධාරීන්ගේ අයදුම්පත් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

4. අයදුම්පත් පහත දැක්වෙන උපලේඛනයේ ඇති ආකෘති පත්‍රයේ ආකාරයට විය යුතු අතර, ඒවා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. තවද, විදේශ සේවය සඳහා අයදුම්කරු සුදුසු බවට හා තෝරාගනු ලැබුවහොත් දැනට දරණ තනතුරෙන් වහාම මුදා හැරීමට හැකි බවටත්, අයදුම්පතේ සඳහන් කර ඇති විස්තර නිවැරදි බවටත්, අයදුම්කරු දැනට සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සටහනක් අයදුම්පත මත විය යුතුය.

5. ගණන් තැබීම හා ආයතන රාජකාරි පිළිබඳව කලින් පළ පුරුද්දක් ඇති නිලධාරීන් ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

6. මෙම තනතුරු සඳහා තෝරා ගනු ලබන නිලධාරීන් විදේශ සේවය සඳහා ශාරීරික වශයෙන් සුදුසුදැයි තීරණය කරනු වස් විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට භාජන විය යුතුය. තවද, ඔවුන් හට අවුරුදු හයකට නොවැඩි කාලසීමාවක් විදේශ සේවය කිරීමට නියම වනු ඇත.

7. තෝරාගනු ලබන නිලධාරීන් හට ඔවුන් දැනට දරණ තනතුරට අයත් අනුමාන මූලික වැටුප ලැබෙන අතර, ලංකාවේදී ගෙවනු ලබන ඒකාබද්ධ වැටුප වෙනුවට විදේශ දීමනාවක් ගෙවනු ඇත. අන්‍ය සේවා කොන්දේසි විදේශ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සළසා ඇති අන්දමට වේ.

8. මීට කලින් මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අයදුම්පත් මෙම තෝරා ගැනීමේදී සලකා බලනු නොලැබේ.

9. අයදුම්පත් 1970 මැයි 31 වන දිනට හෝ ඊට පෙර මෙම අමාත්‍යාංශය වෙත ලැබිය යුතුය.

සී. ගුණසිංහම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය,
සෙනෙට් මන්දිරය, කොළඹ 1,
1970 අප්‍රේල් 9 වන දින දී ය.

### උපලේඛනය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙළපත් නම මුලින්)

2. (අ) උපන් දිනය :————.
(ආ) 1970 මැයි 31 වන දිනට වයස :————.

3. ලිපිනය :—
(අ) කාර්යාලීය :————.
(ආ) පුද්ගලික :————.

4. ජාතිය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. විවාහක නම් දරුවන් ගණන :————.

7. අධ්‍යාපනික සුදුසුකම් :————.

8. (අ) වි. ලි. ප. II පෙළට පත්වූ දිනය :————.
(ආ) රජය යටතේ සේවය කර ඇති අවුරුදු ගණන :————.

9. වර්තමාන වාර්ෂික වැටුප :—
(අ) ඒකාබද්ධ :————.
(ආ) අනුමාන මූලික වැටුප :————.

10. දැනට කරන රාජකාරි ස්වභාවය :————.

11. (අ) ගණන් තැබීමේ පළපුරුදුකම් :————.
(ආ) ආයතන වැඩ පිළිබඳ පළපුරුදුකම් :————.

12. සිංහල භාෂාවෙන් ලබා ඇති ප්‍රවීණතාවය :————.

13. සිංහල යතුරු ලිවීමේ ප්‍රවීණතාවය :————.

14. වෙනත් සුදුසුකම් :————.

ඉහතින් දී ඇති තොරතුරු සත්‍ය බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4-664—1970.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### නිලධාරීන් පුරප්පාඩු—පාලන උපකරණ/කාර්මික (ඉංජිනේරු) යන අංශයන් සඳහා

රාජකීය ලංකා ගුවන් හමුදාවේ, පහත සඳහන් පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:—

(අ) පාලන උපකරණ අංශයේ නිලධාරීන් හතර දෙනෙක්.

(ආ) කාර්මික (ඉංජිනේරු) අංශයේ නිලධාරීන් එක් අයෙක්.

2. තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් හට රාජකීය ලංකා ගුවන් හමුදාවේ නියමු නිලධාරීන් ලෙස අධිකාරයට පත් කරනු ලැබේ.

3. සියලුම නිලධාරීන්ගේ සාමාන්‍ය රාජකාරී හැරුණුවිට, පාලන උපකරණ අංශයේ නිලධාරියෙකුගේ රාජකාරී වනාහි, රාජකීය ලංකා ගුවන් හමුදාවේ සැපයීම් වලට සම්බන්ධිත රාජකාරීන් අයත් වේ. (එනම් උපකරණ බෙදා හැරීම, ඇස්තමේන්තු කිරීම, ඇනයුම් කිරීම, භාර ගැනීම සහ උපකරණ, ගුවන් යානා, රථ වාහන, කාර්මික උපකරණ, ඉන්ධන, පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම සහ ගුවන් හමුදා පාලනය සහ ගිණුම් කටයුතු වන්නේ ය.)

4. සියලුම නිලධාරීන්ගේ සාමාන්‍ය රාජකාරී හැරුණු විට, කාර්මික (ඉංජිනේරු) අංශයේ නිලධාරියෙකු සතු රාජකාරී වනාහි, ගුවන් යානා තැනීම, ගුවන් යානා ඉදිරියට ගමන් කරවීමට අවශ්‍ය යන්ත්‍ර කොටස් සහ එම යන්ත්‍ර, වායු ගත් විද්‍යාව, ගුවන් යානා දාව, ගුවන් යානා වායම, යන්ත්‍ර ප්‍රවාහන, ගුවන් යානාවලට සවිකර ඇති යුද්ධායුධ සහ වෙනත් උපකරණ සාමාන්‍යයෙන් සුද්ධ පවිත්‍ර කර තෙල් ග්‍රීස් යෙදීම, සාමාන්‍ය ඉංජිනේරු ශිල්පය සහ කාර්මික පරිපාලන කටයුතු වලට සම්බන්ධ දේ පිළිබඳ කටයුතු කිරීම වන්නේ ය.

5. අවශ්‍යතාවයක් ඇතිවුවහොත්, ලංකාවේ හෝ පිටරට පුහුණුව පිණිස යැමට තෝරා ගනු ලැබූ අපේක්ෂකයින් හට සිදුවේ.

6. වැටුප් හා දීමනා*.—වැටුප් හා දීමනා පිළිබඳ විස්තර 1961 අප්‍රේල් මස 28 වෙනි දිනැති අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරණ ලදුව කලින් කල සංශෝධනය කරනු ලැබූ 1961 රාජකීය ලංකා ගුවන් හමුදා වැටුප් සංග්‍රහය අනුව වේ.

(අ) නිලධාරීන්ගේ ස්කොඩ්රන් ලීඩර් තනතුර දක්වා ඇති මූලික වේතන විස්තර මෙහි පහත පලවේ :—

**පයිලට් ඔෆිසර්.**—වර්ෂයකට රු. 4,500

**ෆ්ලයින් ඔෆිසර්.**—වර්ෂයකට රු. 4,860 පටන් ගෙන රු. 180 වාර්ෂික වැටුප් වර්ධක දෙකකින් ද රු. 360 එකකින් ද වර්ෂයකට රු. 5,580 දක්වා නගී.

**ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්.**—වර්ෂයකට රු. 6,660 පටන් ගෙන රු. 180 වාර්ෂික වැටුප් වර්ධක හයකින් වර්ෂයකට රු. 7,740 දක්වා නගී.

**ස්කොඩ්රන් ලීඩර්.**—වර්ෂයකට රු. 8,820 පටන්ගෙන රු. 180 වාර්ෂික වැටුප් වර්ධක හයකින් වර්ෂයකට රු. 9,900 දක්වා නගී.

(ආ) **නිල ඇඳුම්.**—අධිකාරියට පත් කරනු ලැබූ නිලධාරියෙකු වූ විගස සර්ම කලාපීය ඇඳුම් සඳහා රු. 650 ක දීමනාවක් ගෙවනු ලැබේ. සේවය සඳහා හෝ පුහුණුව සඳහා විදේශ රටකට මාරු කල විට ඇඳුම් සඳහා තවත් රු. 1,300ක දීමනාවක් ගෙවනු ලැබේ. අවුරුදු දෙකක සේවයක් සම්පූර්ණ කළ පසු නිල ඇඳුම් නඩත්තුව සඳහා මසකට රුපියල් 25 ක දීමනාවක් ගෙවනු ලැබේ.

(ඇ) **සෙසු දීමනා.**—ජීවනාධාර, විශේෂ ජීවනාධාර හා නිවාස කුලි දීමනා රජයේ ප්‍රමානුකූලව ගෙවනු ලැබේ.

* ඉහත සඳහන් වැටුප්, විශ්‍රාම හා පාරිතෝෂික දීමනා ප්‍රමාණයන්ගේ සංශෝධන ඇති කිරීම දැනට සැලකිල්ලට ලක්වී ඇත.

## 'අ' පරිශිෂ්ඨය

**රාජකීය ලංකා ගුවන් හමුදාවේ.......................අධිකාරියන් සඳහා ඉල්ලුම්පත**

(ඉල්ලුම්කරන අංශයේ නම සඳහන් කළ යුතුයි)

1. අගට යෙදෙන නම :————. සෙසු නම් :————.
2. දැනට ලිපිනය :————.
 (i) දුරකථන අංකය :————.
 (ii) තුදුරු දුම්රිය පොළ :————.
 (iii) තුදුරු පොලිස් ස්ථානය :————.
 (iv) විදුලි පණිවුඩ කාර්යාලය :————.
3. ස්ථිර වාසස්ථානය :————.
 එහි වාසය කළ කාලය :————.
4. විවාහක තත්ත්වය :————.
5. ආගම :————.
6. මව්පිය විස්තර :————. උපන් ස්ථානය :————.
 උප්පත්තියෙන් රටවැසිභාවය :————.
 (අ) පියා :————.
 (ආ) මව :————.
7. පාසල් හා විශ්ව විද්‍යාල චරියාව—
 (අ) පාසැල් ආදියෙහි නම් :————.
 (ආ) ඇතුළත් වූ දිනය :————.
 (ඇ) අස් වූ දිනය :————.
8. පාසලෙන් අස් වූ පසු නියුක්ත වූ රක්ෂාව :————.
 (මෙය සම්පූර්ණ වාර්තාවක් විය යුතුයි.)
 (අ) ස්වාමියාගේ නම :————.
 (ආ) රක්ෂාවේ ස්වභාවය :————.
 (ඇ) රක්ෂාවේ කාල සීමාව :————.
9. මීට පෙර යුෂ්මතා සන්නද්ධ සේවයක යම් පුරප්පාඩුවක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට තිබේද ? උත්තරය "ඔව්" නම් ඉල්ලුම් කළ තනතුර හා දිනය දක්වන්න : ————.
10. සිවිල් උසාවියක් හෝ සේවා විනිශ්චය මණ්ඩලයක් විසින් යුෂ්මතා වරදකරු කර තිබේද ? උත්තරය "ඔව්" නම් විස්තර දක්වන්න :————.
11. අවශ්‍ය සුදුසුකම් (මෙම නිවේදනයේ 14 වෙනි ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන් පරිදි) :—
 උපන් දිනය :————. වයස :————. උපන් ස්ථානය :————.
 රටවැසි භාවය :————. උත්පත්තියේ දී :————.
 දැනට :————.
 (අ) යෝග්‍යතා :————.
 (ආ) අධ්‍යාපන සුදුසුකම් :————.
 (එනම් සුදුසුකම් පිළිබඳ 14 වෙනි ඡේදයේ වගන්තිය ප්‍රකාර.)
 (ඇ) උස අඩි :——, අඟල් :——.
 (ඈ) පපුව අඟල් :————.
 (ඉ) බර රාත්තල් :————.
12. අතිරේක සුදුසුකම් :————.
 (පහත සඳහන් අයිතිවාසිකම් සනාථ කිරීමට අයදුම්කරුට හැකිවිය යුතුයි.)
13. ක්‍රීඩා දක්ෂතා විස්තර :————.
 (කණ්ඩායම් හා තරඟ විස්තර දක්වා දිනයන් ද, ලබාගත් දක්ෂතාවයන් ද දක්වන්න.)
14. පාසැලේ දී හෝ විශ්ව විද්‍යාලයේ දී ලබා ගත් අනිකුත් දක්ෂකම් :————.
15. සන්නද්ධ සේවයක (නිත්‍ය හෝ ස්වේච්ඡා)හෝ බාල දක්ෂ ආයතනයක කළ සේවා විස්තර :————.
16. යම්කිසි විශේෂ සුදුසුකම් :————.
17. මෙම අයදුම්පත සමග එවා ඇති දේ :————.
 (පිටපත් පමණක් එවිය යුතුයි.)
18. මෙම අයදුම්පතට අමුණා ඇති වෙනත් දේ :————.
19. චරිත සහතික ලබාගත් අයවළුන්ගේ නම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දාතම :————.

4-827/1—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

**නිලධාරි පුරප්පාඩු—ගගන යාත්‍රාංගන ඉදිකිරීමේ අංශය (වැඩ සේවාව)**

රාජකීය ලංකා ගුවන් හමුදාවේ (වැඩ සේවාවන්හි) ගගන යාත්‍රාංගන ඉදිකිරීමේ අංශයෙහි පුරප්පාඩු දෙකක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරාගනු ලැබූ අපේක්ෂකයනට රාජකීය ලංකා ගුවන් හමුදාවේ අධිකාරියට පත් කරනු ලැබේ. 13 වෙනි ඡේදයේ, අනුඡේද (ඇ) (i) සිට (iii) දක්වා අධ්‍යාපන සුදුසුකම් තිබෙන අපේක්ෂකයන් පයිලට් ලෙෆ්ටිනන්ට් නිලයෙහි අධිකාරියට ද, 13 වෙනි ඡේදයේ, අනුඡේද (ඇ) (iv) සිට (vi) දක්වා අධ්‍යාපන සුදුසුකම් තිබෙන අපේක්ෂකයින් පයිලට් ඔපිසර් නිලයෙහි අධිකාරියට ද පත් කරනු ලැබේ.

3. සියළුම නිලධාරීන්ගේ සාමාන්‍ය රාජකාරි හැරුණුවිට, ගගන යාත්‍රාංගන ඉදිකිරීමේ අංශයේ නිලධාරියෙකුගේ රාජකාරී වනාහි, ගුවන් හමුදාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන, ක්‍රියා කරවන හා පාලනය කරවන ගගන යාත්‍රාංගන, ගොඩනැගිලි, මංමාවත් හා අවශේෂ මධ්‍යස්ථාන ඉදිකිරීම හා නඩත්තු කිරීමත් වන්නේ ය.

4. අවශ්‍යතාවයක් ඇති වුවහොත්, ලංකාවේ හෝ පිටරට පුහුණුව පිණිස යැමට, තෝරා ගනු ලැබූ අපේක්ෂකයින්ට සිදුවේ.

5. **වැටුප් දීමනා*.**—වැටුප් හා දීමනා පිළිබඳ විස්තර 1961 අප්‍රේල් මස 28 වෙනි දිනැති අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරණ ලදුව, වරින් වර සංශෝධනය කරනු ලැබූ 1961 රාජකීය ලංකා ගුවන් හමුදා වැටුප් සංග්‍රහය අනුව වේ.

(අ) විං කොමාන්ඩර් තනතුර දක්වා ඇති මූලික වේතන විස්තර මෙහි පහත පළවේ :—

**පයිලට් ඔපිසර්**—වර්ෂයකට රු. 4,500.

**ප්ලයිං ඔපිසර්**—වර්ෂයකට රු. 4,860 න් පටන් ගෙන රු. 180 වාර්ෂික වැටුප් වර්ධක දෙකකින් සහ රු. 360 වාර්ෂික වැටුප් වර්ධක එකකින් වර්ෂයකට රු. 5,580 දක්වා නගී.

**ප්ලයිට් ලෙෆ්ටිනන්ට්**—වර්ෂයකට රු. 6,660 න් පටන් ගෙන රු. 180 වාර්ෂික වැටුප් වර්ධක හයකින් වර්ෂයකට රු. 7,740 දක්වා නගී.

**ස්කොඩ්රන් ලීඩර්**—වර්ෂයකට රු. 8,820 න් පටන් ගෙන රු. 180 වාර්ෂික වැටුප් වර්ධක හයකින් වර්ෂයකට රු. 9,900 දක්වා නගී.

**විං කොමාන්ඩර්**—වර්ෂයකට රු. 12,105 න් පටන් ගෙන රු. 225 ක් වාර්ෂික වැටුප් වර්ධක හයකින් වර්ෂයකට රු. 13,455 ක් දක්වා නගී.

(ආ) **නිල ඇඳුම්.**—කොමිෂන් බලය ලැබූ නිලධාරියෙකු වූ විගස සර්මකලාපීය ඇඳුම් සඳහා රු. 650 ක දීමනාවක් ගෙවනු ලැබේ. සේවය සඳහා හෝ පුහුණුව සඳහා විදේශ රටකට මාරු කළ විට ඇඳුම් සඳහා තවත් රු. 1,300 ක දීමනාවක් ගෙවනු ලැබේ. අවුරුදු දෙකක සේවයක් සම්පූර්ණ කළ පසු නිල ඇඳුම් නඩත්තු සඳහා මසකට රුපියල් 25 ක දීමනාවක් ගෙවනු ලැබේ.

(ඇ) **සෙසු දීමනා.**—ජීවනාධාර, විශේෂ ජීවනාධාර හා නිවාස කුලී දීමනා රජයේ ප්‍රමාණානුකූලව ගෙවනු ලැබේ.

6. 1962 සැප්තැම්බර් මස 14 වැනි දින අංක 13,301 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර වරින් වර සංශෝධනය කරනු ලැබූ 1962 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. රජය යටතේ කරන ලද ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවයද, කලින් ලංකා ආරක්ෂක හමුදාවක් යටතේ හෝ බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලයේ වෙනත් කිසියම් සන්නද්ධ සේවයක යෙදී සිටියේ නම් එම සේවය ද විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගනු ලැබේ.

*ඉහත සඳහන් වැටුප්, විශ්‍රාම හා පාරිතෝෂික දීමනා ප්‍රමාණයන්ගේ සංශෝධනයක් ඇති කිරීම දැනට සැලකිල්ලට ලක්වී ඇත.

7. **සේවා කොන්දේසි.**—රාජකීය ලංකා ගුවන් හමුදා නිලධාරියෙකුගේ සේවා කොන්දේසි තීරණය වන්නේ 1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10,240 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර වරින් වර සංශෝධනය කරනු ලැබූ රාජකීය ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උප සේවා) නියෝග අනුවයි.

8. නිලධාරි නිවසේ පදිංචි අවිවාහක නිලධාරියෙකුට ගෘහභාණ්ඩ සහිත නිල නිවාස පහසුකම්, ආහාර හා බැට්මන් සේවය ද සපයනු ලැබේ.

9. විවාහක නිලධාරියෙකුට හැකි නම් නිවාසයක් සපයා පුද්ගලික බැට්මන් සේවය වෙනුවට දීමනාවක් ගෙවනු ලැබේ.

10. රාජකාරි හෝ පුහුණුව පිණිස ලෝකයේ කවර පෙදෙසක හෝ සෑම විටම සේවය කිරීමට ගුවන් හමුදා නිලධාරීන් බැඳී ඇත.

11. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම පිණිස මේ දක්වා පනවා ඇති හෝ ඉදිරි කාලයෙහි පැනවෙන හෝ ව්‍යවස්ථාවන්, තෝරා ගනු ලැබූ අපේක්ෂකයා විසින් පිළිපැදිය යුතුයි.

12. සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දායක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4 ක මුදලක් අඩුකර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරා ගනු ලබන අපේක්ෂකයා විසින් දිය යුත්තේ ය.

13. **මූලික අවශ්‍යතා.**—අයදුම්කරුවන්ට මෙහි පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි :—

(අ) **ජාතිය.**—අයදුම්කරුවන්—

(i) උත්පත්තියෙන්, හෝ

(ii) ලියාපදිංචි කරනු ලැබීමෙන් ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ආ) **වයස.**—අයදුම්කරුවන් 1970 ජූලි මස 1 වැනි දිනට අවුරුදු 33 නොඉක්මවා තිබිය යුතුයි.

(ඇ) **අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම් වලින් එකක් තිබෙන බවට අයදුම්කරුවන් විසින් සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(i) සිවිල් ඉංජිනේරු ආයතනයේ සහභාගි සාමාජිකත්වය, විදුලි ඉංජිනේරු ආයතනයේ සහභාගි සාමාජිකත්වය,

හෝ

යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ සහභාගි සාමාජිකත්වය.

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු ශිල්පය පිළිබඳ උපාධිධරයෙකු වීම.

(iii) සිවිල් ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය, විදුලි ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය හෝ යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය පිළිබඳ පරීක්ෂණවල I හා II කොටස් හෝ (අ) හා (ආ) ඡේද සඳහා පුහුණුවීමේ පාඨමාලාවන් සමර්ථ ලෙස අවසන් කර තිබීම සහ සිවිල්, විදුලි හෝ යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයන් විසින් ඉංජිනේරු ආයතන වල විභාගවල තෙවෙනි කොටසට හෝ (ඇ) අංශයට පෙනී සිටීමට අවසර දී තිබීම.

පහත සඳහන්ව ඇති විශේෂ සුදුසුකම් හෝ පළපුරුදුකම් ලබා ඇති අයදුම්කරුවන් ගැන සලකා බලනු ලැබේ :—

(iv) ලංකා කාර්මික විද්‍යාලයේ සිවිල්, විදුලි හෝ යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳව ඩිප්ලෝමා උපාධියක් ලබා තිබීම සහ රජයේ හෝ පිළිගත් ඉංජිනේරු සමාගමක අවුරුදු තුනකට නො අඩු කාලයක පළ පුරුද්දක් තිබීම ; හෝ

(v) කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකයක් (සිවිල් හෝ යාන්ත්‍රික සහ විදුලි) ලබා තිබීම, සහ ඊට පසුව රජයේ හෝ පිළිගත් ඉංජිනේරු සමාගමක අවුරුදු පහකට නොඅඩු කාලයක ගොඩනැගිලි තැනීම පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්දක් තිබීම ; හෝ

(vi) වෘත්තීය ඉංජිනේරු ආයතනවල I වැනි ඒකාබද්ධ කොටස (Joint Part I) ("අ" අංශය) සමත් වී සිටීම සහ ඊට පසුව රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ඉංජිනේරු සමාගමක අවුරුදු 5කට නො අඩු කාලයක ප්‍රායෝගික පළපුරුද්දක් තිබිය යුතු ය.

(සාමාන්‍ය සුදුසුකම් වලට යටත්ව ඉහත සඳහන් කාර්මික සුදුසුකම් වලට අමතරව රජයේ දෙපාර්තමේන්තුවක හෝ ඒ පිළිබඳ ඉංජිනේරු සමාගමක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා ඇති අපේක්ෂකයින් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ).

(ඇ) **සෞඛ්‍ය තත්ත්වය :** අපේක්ෂකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය ගුවන් හමුදාවට ගැලපෙන පරිදි තිබිය යුතුයි. (අඩු වශයෙන් උස අඩි 5 අඟල් 5යි. පපුව අඟල් 32යි. බර රාත්තල් 105යි.)

14. **අයදුම්කරුවන්ට උපදෙස්.**—මෙම නිවේදනයේ "අ" පරිශිෂ්ඨයේ දැක්වෙන පරිදි අයදුම්පත් සකස් කළ යුතුයි. මුද්‍රණය කරන ලද අයදුම්පත් නොමැති බවත් අයදුම්කරුවන් විසින් තම තමන්ගේ අයදුම්පත් සකස් කරගත යුතු අතර, නියමිත ආකෘති පත්‍රය අනුව නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

15. අයදුම්පත් "ගුවන් හමුදාධිපති, තැ. පෙ. 594, කොළඹ" යන ලිපිනයට එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ "අයදුම්පත්—ගගන යාත්‍රාංගන ඉදිකිරීමේ අංශය (වැඩ සේවාව) නිලධාරී" යනුවෙන් වම් පැත්තේ උඩ කොණේ සඳහන් කර තිබිය යුතුයි. අයදුම්පත් 1970 මැයි මස 19 වෙනි දින තෙක් භාර ගනු ලැබේ.

16. ඉහත 13 වැනි ඡේදයේ සඳහන් වන සුදුසුකම් මත මිස, වෙන මොනයම් හේතුවක් නිසාවත් අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

17. අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි වල පිටපත් ද ඉදිරිපත් කළ යුතුයි :—

(අ) අයදුම්කරුගේ උප්පැන්න සහතිකය,

(ආ) ලබාගත් උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) අඩු වශයෙන් අයදුම්කරු පුද්ගලිකව ඇසුරු කරන වගකිව යුතු පුද්ගලයින් දෙදෙනෙකුගෙන් ලබා ගත් චරිත සහතික පත්‍ර,

(ඈ) අයදුම්පතෙහි සඳහන් කර ඇති යම් කරුණක් සනාථ කිරීමට සහතිකපත් ඇත්නම් ඒවා.

18. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් එවිය යුත්තේ තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මාර්ගයෙනි. තෝරා ගනු ලැබුවහොත් අයදුම්කරු නිදහස් කළ හැකි බවට සහතිකයක් ද එහි තිබිය යුතුයි.

19. **තෝරා ගැනීම් සහ සම්මුඛ පරීක්ෂණ ආදිය.**—සම් අයදුම්කරුවකු සුදුසු යයි සලකනු ලැබුව හොත් තමාගේ වියදමින් තෝරා ගැනීමේ මණ්ඩලයක් ඉදිරිපිට පෙනී සිටීමට උපදෙස් දෙනවා ඇත.

20. ප්‍රාථමික තේරීම් මණ්ඩලය මගින් සුදුසු යයි සලකනු ලබන අයදුම් කරුවන් අවසාන තේරීම් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර, ගුවන් හමුදුව මගින් පවත්වන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, ඔවුන් නිලධාරි ස්වභාවය මැනීමේ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු යි.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාධිපති.

1970 අප්‍රේල් මස 24 වෙනි දින,
ගුවන් හමුදා මූලස්ථානය,
තැ. පෙ. 594,
කොළඹ.

## "අ" පරිශිෂ්ඨය

### රාජකීය ලංකා ගුවන් හමුදාවේ ගගන යාත්‍රාංගන ඉදිකිරීමේ අංශයේ (වැඩ සේවාව) අධිකාරියක් සඳහා ඉල්ලුම්පත්‍රය

1. අගට යෙදෙන නම :————.
   සෙසු නම් :————.

2. දැනට ලිපිනය :————.
   (i) දුරකථන අංකය :————.
   (ii) නුදුරු දුම්රියපළ :————.
   (iii) නුදුරු පොලිස් ස්ථානය :————.
   (iv) විදුලි පණිවුඩ කාර්යාලය :————.

3. ස්ථිර වාසස්ථානය :————.
   එහි වාසය කළ කාලය :————.

4. විවාහක තත්ත්වය :————.

5. ආගම :————.

6. මවු පිය විස්තර :————.
   නම :———, උපන් ස්ථානය :———, උත්පත්තියෙන් රට වැසිභාවය :————.
   (අ) පියා :————.
   (ආ) මව :————.

7. පාසල් හා විශ්ව විද්‍යාල චරියාව :—
   (අ) පාසල් ආදියෙහි නම් :————.
   (ආ) ඇතුළත් වූ දිනය :————.
   (ඇ) අස් වූ දිනය :————.

8. පාසලෙන් අස් වූ පසු නියුක්ත වූ රක්ෂාවල් (මෙය සම්පූර්ණ වාර්තාවක් යුතුයි) :————.
   (අ) ස්වාමියාගේ නම :————.
   (ආ) රක්ෂාවෙහි ස්වභාවය :————.
   (ඇ) රක්ෂාවෙහි කාල සීමාව :————.

9. මීට ප්‍රථම යුෂ්මතා සන්නද්ධ සේවයක යම් පුරප්පාඩුවක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනීසිට තිබේ ද? එසේ නම් ඉල්ලුම්කළ තනතුරු විස්තර හා දිනයන් ද දක්වන්න: ————.

10. සිවිල් උසාවියකින් හෝ සේවා විනිශ්චය මණ්ඩලයකින් යුෂ්මතා වරදට පත්කර තිබේ ද? උත්තරය "ඔව්" නම් විස්තර දක්වන්න :————.

11. අවශ්‍ය සුදුසුකම් (මෙම නිවේදනයේ 13 වැනි ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන් පරිදි) :—
    උපන් දිනය :———, වයස :———, උපන් ස්ථානය : ————.
    රටවැසි භාවය :————
    උත්පත්තියේ දී :————.
    දැනට :————.
    (අ) යෝග්‍යතා :————.
    (ආ) අධ්‍යාපන සුදුසුකම් (එනම් සුදුසුකම් පිළිබඳ 13 වැනි ඡේදයේ වගන්තිය ප්‍රකාර) :————.

12. අතිරේක සුදුසුකම් (පහත සඳහන් අයිතිවාසිකම් සනාථ කිරීමට අයදුම්කරුනට හැකි විය යුතුයි.) :————.

13. ක්‍රීඩා දක්ෂතා විස්තර (කණ්ඩායම් හා තරඟ විස්තර දක්වා දිනයන් ද හා ලබාගත් දක්ෂතාවයන් ද සඳහන් කරන්න.) :————.

14. පාසලේ දී හෝ විශ්ව විද්‍යාලයේ දී ලබාගත් අනෙකුත් දක්ෂකම් :————.

15. සන්නද්ධ සේවයක (නිත්‍ය හෝ ස්වේච්ඡා හෝ බාලදක්ෂ ආයතනයක) කළ සේවා විස්තර :————.

16. යම්කිසි විශේෂ සුදුසුකම් :————.

17. මෙම අයදුම්පත සමග එවන දේ (පිටපත් පමණක් එවිය යුතුයි) :————.

18. මෙම අයදුම්පතට අමුනා ඇති වෙනත් දේ :————.

19. චරිත සහතික ලබාගත් අයවලුන්ගේ නම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–827/2—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර නගර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ ලේකම් ධූරය

රත්නපුර නගරය තුල ස්ථිර පදිංචියක් ඇති, විවාහක, තම බිරිඳ ජීවත්ව සිටින අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු මුස්ලිම් ජාතිකයින්ගෙන් ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායඝාලය, ග්‍රාම සේවක කායඝාල, පළාත් පාලන ආයතන, උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳපලවල් සහ සමුපකාර සමිති ආදී ප්‍රදේශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායඝාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කායඝාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 මැයි මස 16 වැනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

ඇස්. ජී. සමරසිංහ,
අතිරේක දිසාපති,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1970 අප්‍රේල් මස 11 වෙනි දින,
රත්නපුරේ,
දිස්ත්‍රික් රෙජිස්ත්‍රාර් කායඝාලයේ දී ය.

4–692—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## ගාලු දිස්ත්‍රික්කයේ කොට්ටාව කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ තල්පෙ පත්තුව කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය

කොට්ටාව උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගෙන් සැළකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිළධාරි කායඝාල, ග්‍රාම සේවක කායඝාල, පළාත් පාලන ආයතන කායඝාල, ග්‍රාමීය උසාවි, තැපැල් කායඝාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳපොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 ජූනි මස 15 වෙනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය.

පී. ඒ. ඩී. ගුණසිංහ,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 අප්‍රේල් මස 9 වෙනි දින,
ගාල්ලේ දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දීය.

4–690—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

## කොළඹ දිස්ත්‍රික්කයේ නාරන්වල කොට්ඨාශයේ උප්පැන්න හා මරණ බටහිර සියනෑ කෝරළේ කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

නාරන්වල උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳපොළවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 මැයි මස 17 වැනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රිචර්ඩ් ගුණසේකර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

1970 අප්‍රේල් මස 7 වැනි දින,
කොළඹ, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී ය.

4-660—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ (මෝදර) කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

මෝදර ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳපොළවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 මැයි මස 17 වැනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රිචර්ඩ් ගුණසේකර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

1970 අප්‍රේල් මස 5 වැනි දින,
කොළඹ, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී ය.

4-658—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ රදාවාන කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ නැගෙනහිර සියනෑකෝරළේ කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

රදාවාන උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳපොළවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 මැයි මස 17 වැනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රිචර්ඩ් ගුණසේකර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

1970 අප්‍රේල් මස 7 වැනි දින,
කොළඹ, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී ය.

4-659—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### කල්මුණ උප කොට්ඨාශය

මඩකලපුව නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් කල්මුණ උප කොට්ඨාශයට අයත් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් 1970 මැයි මස 7 වැනි දින පෙරවරු 10. දක්වා භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එදිනදී උදේ 10.05 ට සිදු කෙරේ.

| වැඩ විස්තර | ලියා පදිංචිවූ ගණන රුපියල් | තැන්පත් මුදල රුපියල් |
|---|---|---|
| කල්මුණ උප කොට්සේ ගල්ඔයා වම්ඉවුරේ නෙල්ලුවේනෙයි කාණ්ඩමට ප්‍රයෝජනයක් සඳහා සිල්ලිකොඩි ආරු හරහා අමුණක් ඉදි කිරීම | 22,000 ... | 50 |
| කල්මුණ උප කොටසේ ගල්ඔයා වම්ඉවුරේ අලියාර්වෙට්ටෙයි කාණ්ඩමට ප්‍රයෝජනයක් සඳහා නාවට්කිරි ආරු හරහා අමුණක් ඉදි කිරීම | 43,000 ... | 50 |

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එම වැඩ ඉදිරියේ දක්වා ඇති අයුරු හෝ ඊට වැඩි ගණන්වලට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට, ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

1970 මැයි මස 3 වැනි දින සවස 4. දක්වා කල්මුණ, අම්පාර හා වෙන්කලඩි උප කොට්ඨාශයන්හි වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලයන්, කාර්යාල වේලාවන් තුලදී ලබා ගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් අයදුම්පත් සකස්කොට දෙපිටපතකින් එවිය යුතුයි. ටෙන්ඩර් ආකෘති පත් සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචිවීමේ පොත් සහ දැනට ඔවුන් කරන දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම පිළිබඳව ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ තිබෙද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු වෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කරන කවරයේ වම් පැත්තේ උඩ කොණේ වැඩයේ නම සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් හෝ මඩකලපුව නැගෙනහිර කොටඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ මෙම කාර්ය සඳහා සපයා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැක.

ටෙන්ඩර් තැන්පත් මුදල වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

මෙම ටෙන්ඩර් ගැන වැඩි විස්තර කල්මුණේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්‍යාලයෙන් කායර්‍යාල වේලාව තුලදී ලබාගත හැක. ටෙන්ඩර් භාරගත් වහාම වැඩ ආරම්භ කරගෙන 1970 ඔක්තෝබර් මස 31 වැනි දිනට පෙර සම්පූර්ණ කළ යුතුයි. ප්‍රමාද වූ හැම සුමානයකටම හා සුමානයකින් කොටසට රු. 50 ප්‍රමාණ කළ අලාභ වශයෙන් අයකරනු ලැබේ.

සී. ශන්මුගරාජා,
වාරිමාර්ග ඉංජිනේරු
කල්මුණ උ.කො.

වාරිමාර්ග කාර්යාලය,
කල්මුණ. 1970.4.9.

4-634—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ තම ඇතුලත් වී ඇති කිසිවෙකු සමඟ හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතූන් උඩ මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධවන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනක කාර්යාලීය වේලාවන් තුළදී සැලැසුම් පරීක්ෂාකර බැලීමට මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුලත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර්පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලැසුම් ආදියත්, පරීක්ෂාකර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර කාර්යාලීය වේලාවන් තුළදී මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුලත්විය යුතුය. "ගොවිජනසේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුර දරණ නිලධාරී තැනය. ගිවිසුම්පත්‍රයේ අඩංගුවිය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියාකරන වෙනත් නිලධාරියෙකු විසින් 1970 මැයි මස 14 වැනි දින පෙරවරු 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැනගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරී තැන විසින් ටෙන්ඩර්කරුගේ නම හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර්පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියලුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින සිට මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

බී. පී. ඇම්. විජයදෝරු,
ගොවිජනසේවා සහකාර කොමසාරිස්,
මහනුවර දිස්ත්‍රික්කය.

මහනුවර දිස්ත්‍රික්කයේ,
ගොවිජනසේවා සහකාර කොමසාරිස්තැනගේ කාර්යාලය,
1970 අප්‍රේල් මස 7 වැනි දින දීය.

4–625—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව — අම්පාර උප කොටස

පහත දක්වෙන වැඩ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් අයදුම්පත් 1970 මැයි මස 30 වෙනි සෙනසුරාද පෙරවරු 10 දක්වා මඩකලපුව නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලය විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එම වැඩ ඉදිරියේ දක්වා ඇති අයුරු හෝ ඊට වැඩි ගණන්වලට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

| ටෙන්ඩර් අංකය | වැඩයේ නම | ලියාපදිංචිවූ ගණන | තැන්පත් මුදල |
|---|---|---|---|
| අ/2/69–70 | අම්පාර උප කොටසේ ගංගා ප්‍රදේශයේ මල්කම්පිටි අමුණ ඉදිකිරීම | රු. 80,000 | රු. : 100 |

1970 මැයි මස 25 වෙනි සඳුද සවස 4 දක්වා අම්පාර කල්මුණ හා වෙන්කල්අඩි උප කොට්ඨාශයන්හි වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කායර්‍යාලයන්ගෙන් කායර්‍යාල වේලාවන් තුලදී ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කොට එවිය යුතුය. ටෙන්ඩර් ආකෘති පත් සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචිවීමේ පොත් සහ දැනට ඔවුන් කරන, දෙපාර්තමේන්තුවේ වැඩසහ ඒවායේ වටිනාකම පිළිබඳව ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ තිබේද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති නිකුත් කිරීමට පෙර, වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්‍යාලයේ ඉහත සඳහන් ප්‍රකාර ටෙන්ඩර් මුදල් තැන්පත් කළයුතුව ඇති අතර, එසේ නැතහොත් දිසාපති කායර්‍යාලයක එවැනි තැන්පත් කිරීමක් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. මෙම ටෙන්ඩර් පිළිබඳව වැඩි විස්තර අම්පාර උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්‍යාලයෙන් කායර්‍යාල වේලාවන්තුලදී ලබා ගත හැක.

එන්. ජී. තාමෝදරම්,
ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන,
නැගෙනහිර කොට්ඨාශය.

1970 අප්‍රේල් මස 8 වෙනි දින,
ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කායර්‍යාලය, මඩකලපුව.

4–695—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමයේ, උකුවෙල කොටසේ 'බී' වගීයේ අධි ස්ථිර (පූට්ටු) ගොඩනැගිලි අංක 2 සහ 3 ඉදිකිරීම සඳහා 1970. 5. 6 දින පෙ. ව. 10 දක්වා පොල්ගොල්ල, මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් බාරගනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 23,000 ක හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැකිය.

1970. 4. 18 දින සිට 1970.5.2 දින දක්වා (දෙදිනම ඇතුලුව) කාර්යාල වේලාවන් තුලදී, පොල්ගොල්ල, උකුවෙල, බෝවතැන්න සහ මාතලේ යන වාරිමාර්ග කාර්යාල වලින් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මවල, පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ෆෝර්ම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචිය දක්වෙන පොත් සහ දැනට තමා යටතේ ඇති දෙපාර්තමේන්තු වැඩ හා ප්‍රගතිය සඳහන් ප්‍රකාශයන් ඉදිරිපත් කළ යුතු අතර රු. 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක්ද ඉදිරිපත් කළ යුතුය. මෙම වැඩ පිළිබඳ සම්පූර්ණ විස්තර කාර්යාලීය වේලාවන් තුලදී මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ, උකුවෙල වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිය.

කේ. බාලරත්නම්,
වාරිමාර්ග ඉංජිනේරු, උකුවෙල.

1970. 4. 10 දින,
උකුවෙල (මහවැලි) වාරිමාර්ග කාර්යාලයේදීය.
උකුවෙල.

4–711—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය | කර්මාන්තයේ නම |
|---|---|
| කඩවත මැද කෝරළය ... | 1. පොල්ලමුරේ රාමරාව ඇල ප්‍රතිසංස්කරණය |
| | 2. ගලගම, තැන්නෙ කුඹුරුයාය ඇල ප්‍රතිසංස්කරණය |
| | 3. කිංචිගුනේ කලවැල්පෙ ඇල දියුණු කිරීම |
| | 4. දන්දෙනිය ඇදපල්දෙනිය වැව සංස්කරණය |
| | 5. උතුරු හුණුවල උපාසකගෙ අමුණ ප්‍රතිසංස්කරණය |
| | 6. පනාන කරඳ ඉරේ අමුණ |
| | 7. බුලත්ගම පොල්වත්ත අමුණ ඇල ප්‍රතිසංස්කරණය |
| | 8. ඕපනායක අරාවෙ ඇල දියුණු කිරීම |
| | 9. මැද්දේගම ඔලගංවත්ත අමුණ දියුණු කිරීම |
| කුකුල් කෝරළය ... | 1. වැවගම, මහවෙල්යාය කුඹුර කඩාඩුව තැනීම |
| | 2. ගලතුර, කණුකැටිය වේල්ල දියුණු කිරීම |
| | 3. වැද්දාගල, බිංතැනියාය අමුණ ප්‍රතිසංස්කරණය |
| කුරුවිට කෝරළය ... | 1. කිරිපෝරුව, දෙල්ගහ කුඹුරේ අමුණට ලැලි සැපයීම |
| | 2. කිරිඇල්ල, වතුරාව වේල්ල අමුණ ඉදිකිරීම |
| නවදුන් කෝරළය ... | 1. කුට්ටපිටියේ, හිරි කුඹුර අමුණ තැනීම |
| අටකලන් කෝරළය ... | 1. හපුරුදෙනියේ, කොටකෙතන අමුණ ප්‍රතිසංස්කරණය |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970 මැයි මස 8 දින දවල් 12 දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන් වල සංශෝධනයන් සර තිබේ නම්, ඒ හැමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "රත්නපුර දිස්ත්‍රික්කයේ සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර, 1970 මැයි මස 9 දින දවල් 12 ට පෙර රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරී තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම්දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දිනා සිට, දශ දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුළත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුවද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයන්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි වීමෙන් ලංකාවේ පුරවැසි යන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1970 මැයි මස 10 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිල ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගනන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිල ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

පී. එච්. චන්ද්‍රදාස,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්.
රත්නපුර දිස්ත්‍රික්කය.

රත්නපුර දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය.
1970 අප්‍රේල් මස 9 දින දීය.

4–633—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් විවිධ සේවා සමුපකාර සමිති වලින්, ග්‍රාම සංවර්ධන සමිතිවලින් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

### ටෙන්ඩර් කැඳවීමට ඇති වැඩ ලැයිස්තුව

**මීරිගම ගම්වගා නිලධාරි කොට්ඨාශය.**

(1) අංක 12 බෝතලේ ඉහලගම ගො. කා. ස. ප්‍රදේශයේ : ලෙන්නරේ පැති බැම්ම සහ වෑක්වර් පාලම තැනීම.
(2) අංක 13 පිරිස්යාල කඩිගමුව ගො. කා. ස. ප්‍රදේශයේ : පනික්කියා කුඹුර ජලදොරෙහි ඉතිරි වැඩ.
(3) අංක 22 ගස්පෙ කොස්ඇට දෙණිය ගො. කා. ස. ප්‍රදේශයේ : උඩුඋල්ලේ සිට ඇල ශුද්ධකිරීම.
(4) අංක 28 බලගල්ල ගො. කා. ස. ප්‍රදේශයේ : ඇටඹගහ දෙණිය කෙන්ද කුඹුර ජලදොර තැනීම.

**නිට්ටඹුව ගම්වගා නිලධාරි කොට්ඨාශය.**

(5) අංක 40 රදාවඩුන්න ගො. කා. ස. ප්‍රදේශයේ : කඳනවෙලේ අමුණ තැනීම.
(6) අංක 46 කුරුවිලාන ගො.කා.ස. ප්‍රදේශයේ : කැරවිලාන බිත්බෝපේ අමුණ ප්‍රතිසංස්කරණය කිරීම.
(7) අංක 49 රතඹලේ ගො. කා. ස. ප්‍රදේශයේ : බෝපගම වානේ කුඹුර අමුණ තැනීම.

**කිරිඳිවැල ගම්වගා නිලධාරි කොට්ඨාශය.**

(8) අංක 50 මැද්දේගම ගො. කා. ස. ප්‍රදේශයේ : ගමේ කුඹුර අමුණ තැනීම.
(9) අංක 64 පැලහැල ගො. කා. ස. ප්‍රදේශයේ : ලංසියා දෙණිය යායට වෑක්වර් පාලමක් තැනීම.
(10) අංක 64 පැලහැල ගො. කා. ස. ප්‍රදේශයේ : පැලහැල වල් අරඹ අමුණ තැනීම.
(11) අංක 64 පැලහැල ගො. කා. ස. ප්‍රදේශයේ : පැලහැල වෑක්වර් පාලම තැනීම.
(12) අංක 58 මණ්ඩාවල ගො. කා. ස. ප්‍රදේශයේ : බෙල්ලන්දොල අමුණ තැනීම.

**ඉඹුල්ගොඩ ගම්වගා නිලධාරි කොට්ඨාශය.**

(13) අංක 86 බැලුම්මහර ගො. කා. ස. ප්‍රදේශයේ : මුදියන්සෙගෙ කුඹුර අමුණට ලෑලි සැපයීම.
(14) අංක 114 වටද්දර ගො. කා. ස. ප්‍රදේශයේ : වටද්දර ඇල ශුද්ධ කිරීම.
(15) අංක 115 උතුවන්බෝගහ වත්ත ගො. කා. ස. ප්‍රදේශයේ : වඳුරවඹලියගම් ඇල පොරෝමාරුව අමුණ තැනීම.

**කඩවත ගම්වගා නිලධාරි කොට්ඨාශය.**

(16) අංක 171 කැන්දලියද්දපාලුව ගො. කා. ස. ප්‍රදේශයේ : සුරියාපාලුවයායේ උඩ වේල්ලේ කලුගල කැඩීම.
(17) අංක 182 මාකොළ ගො. කා. ස. ප්‍රදේශයේ : ලිංගහ අගාරය වම්පස ඇල ශුද්ධ කිරීම.
(18) අංක 182 මාකොළ ගො. කා. ස. ප්‍රදේශයේ : වැල්ලමුර අගාරය වම්පස පිට ඇල ශුද්ධ කිරීම.
(19) අංක 184 සියඹලාපේ ගො. කා. ස. ප්‍රදේශයේ : ගොඩපරගහ කුඹුර නොහොත් මිල්ලගහ කුඹුර හරක් පැන්නුම තැනීම.
(20) අංක 187 මාබිම ගො. කා. ස. ප්‍රදේශයේ : පට්පිවල යායේ සිට මාබිම අගාරයේ යායට වෑක්වර් පැන්නුම තැනීම.
(21) අංක 179 කැලණිය ගො. කා. ස. ප්‍රදේශයේ : පෙතියගොඩ නොහොත් බයන්නාව ඇල ශුද්ධ කිරීම.
(22) අංක 194 ගෝනවල ගො. කා. ස. ප්‍රදේශයේ : සපුගස්කන්දේ සිට පමුණුවිල දක්වා මැද ඇල ශුද්ධ කිරීම.
(23) අංක 194 ගෝනවල ගො. කා. ස. ප්‍රදේශයේ : බටලීයදිගම්පොත ඇල ශුද්ධ කිරීම.

**කඳාන ගම්වගා නිලධාරි කොට්ඨාශය.**

(24) අංක 202 ඇලපිටිවල ගො. කා. ස. ප්‍රදේශයේ : ගල්උඩුපිට කොටදෙපා ඇල ශුද්ධ කිරීම.
(25) අංක 202 ඇලපිටිවල ගො. කා ස. ප්‍රදේශයේ : හොරපෙතුඩුවේ හීන් ඇල ශුද්ධ කිරීම.
(26) අංක 220 බොල්ලත ගො. කා. ස. ප්‍රදේශයේ : වලකුඹුර අමුණ තැනීම.
(27) අංක 220 ඒ පොල් පිටිමුකලාන ගො. කා. ස. ප්‍රදේශයේ : හෙට්ටියාගාර වෑක්වර් පැනුම තැනීම.

**නුගේගොඩ ගම්වගා නිලධාරි කොට්ඨාශය.**

(28) අංක 239 පැපිලියාන ගො. කා. ස. ප්‍රදේශයේ : කළුබෝවිල—බටහිර විලවල යාය ඇල ශුඬ කිරීම.
(29) අංක 240 අත්තිඩිය බටහිර ගො. කා. ස. ප්‍රදේශයේ : තිකපෙ දෙපා ඇල සුද්ධ කිරීම.
(30) අංක 273ඒ—කලපලුවාව ගො. කා. ස. ප්‍රදේශයේ : මාදින්න ගොඩ මහනියරේ සිට මැද ඇල ප්‍රතිසංස්කරණය කිරීම.

**පිළියන්දල ගම්වගා නිලධාරි කොට්ඨාශය.**

(31) අංක 251 බටහිර ඇරව්වල ගො. කා. ස. ප්‍රදේශයේ : ගලකඩුල්ල අමුනේ කඩාඩු පිරවීම.
(32) අංක 251 බටහිර ඇරව්වල ගො. කා. ස. ප්‍රදේශයේ : ඇරව්වල මහ ඇලෙහි වැලිපත නොහොත් කම්මල කුඹුරේ කඩාඩු තැනීම.
(33) අංක 264—කිරිගම්පමුණුව—මත්තෙගොඩ ගො. කා. ස. ප්‍රදේශයේ : මත්තෙගොඩ දෙණිය මැද ඇල හා බෝක්කුව තැනීම.
(34) අංක 264—කිරිගම්පමුණුව—මත්තෙගොඩ ගො. කා. ස. ප්‍රදේශයේ : ඊරියගහ කුඹුර නොහොත් මහ ඇල හරහා වෑක්වර් මංකඩ තැනීම.

**මිණුවන්ගොඩ ගම්වගා නිලධාරි කොට්ඨාශය.**

(35) අංක 134 මැඩැමුල්ල බොරගොඩවත්ත ගො. කා. ස. ප්‍රදේශයේ : නිල්පනාගොඩ තිත්තගහ කුඹුර ජලදොර අලුත් වැඩියාව.

**හංවැල්ල ගම්වගා නිලධාරි කොට්ඨාශය.**

(36) අංක 312 වේවැල් පනාව ගලගොඩදර ගො. කා. ස. ප්‍රදේශයේ : මීපේ ඇල පැති බැම්ම තැනීම.
(37) අංක 314 දඹෝර උඩගම ගො. කා. ස. ප්‍රදේශයේ : දව්වදෙනිය අමුණ තැනීම අංක 1.

(38) අංක 314 දඹෝර උඩගම ගො. කා. ස. ප්‍රදේශයේ : දාච්චදෙනිය අමුණ තැනීම අංක 2.

(39) අංක 317 වේරගල ගො. කා. ස. ප්‍රදේශයේ : බමරඹිවිට පැති බැම්ම තැනීම.

(40) අංක 317 වේරගල ගො. කා. ස. ප්‍රදේශයේ : කිතුලදෙණිය අමුණ තැනීම.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970 මැයි මස 9 දින දවල් 12 දක්වා කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළයුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර් කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දක්විය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා සීල් තබන ලද ලියුම් කවරවල බහා, කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "............... සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1970 මැයි මස 10 දින දවල් 12 ට පෙර කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර් කරුට ඒ බව කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුලත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැගෙන හේතූන් උඩ, කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුලත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත් කරු විසින් සැපයිය යුතුය.

13. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1970 මැයි මස 11 දින පෙ. ව. 9.30 ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිල ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

අමර හේවාමද්දුම,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කොළඹ දිස්ත්‍රික්කය.

කොළඹ දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන ගේ කාර්යාලය,
1970 අප්‍රේල් මස 11 දින දීය.

4–696—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**මහඉළුප්පල්ලම පාසැල් ගොවිපලට හා හිඟුරක්ගොඩ ගොවිපලට බිම් මට්ටම් කිරීමේ නගුල් දෙකක් ලබාගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි**

මහඉළුප්පල්ලම පාසැල් ගොවිපලට සහ හිඟුරක්ගොඩ යන රජයේ ගොවිපලවල් දෙකට පහත සඳහන් අන්දමේ බිම් මට්ටම් කිරීමේ නගුල් දෙකක් ලබාගැනීම සඳහා, ටෙන්ඩර් පත්‍ර, අනුරාධපුර කෘෂිකර්ම නිලධාරි (ගොවිපල් පාලන හා නිෂ්පාදන) කාර්යාලයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970. 5. 9 වැනි දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ.

බිම් මට්ටම් කිරීමේ නගුල සම්බන්ධයෙන් වූ විස්තර පහත සඳහන් වේ.

අශ්වබල 35—67 අතරේ ක්‍රියාකාරී ට්‍රැක්ටරයකට ඈමිණිය හැකි ඩ්‍රෝරු දෙකක්,

දිගුකර හෝ තනිකරම අඩි 8 ක් පළලට ඇතිවූද, අඟල් 20 ක පරතරයකදී අංශක 0—60 ප්‍රමාණයට තලය ඉදිරියට හෝ පසුපසට සකස් කළ හැකිවූ ද, අංශක 0—40 දක්වා සකස් කළ හැකි පිව් එකක් ඇති තලයකින් පෝරුව සමන්විත විය යුතුය. පෝරුවට පහත සඳහන් අමතර දෑ තිබිය යුතුය.

(1) ග්‍රේඩ් වීල් කිට් එකක්.

(2) තල දිගුකරන කිට් එකක්.

(3) සයිඩ් ප්ලේට් කිට් එකක්.

(4) සයිඩ් ෂූ කිට් එකක්.

පෝරුව සම්පූර්ණයෙන් රාත්තල් 380 කට වඩා බර නොවිය යුතු අතර පෝරුවෙන් බිම මට්ටම් කිරීම, අවශ්‍ය පරිදි භූමි නැග්මක් සකස් කර ගැනීම, පස් ඇදීම හා ටෙරස් සෑදීම ආදිය කළ හැකි විය යුතුය.

මෙම යන්ත්‍රය සමඟ ඊට අදාල වූ අවි ආයුධ කට්ටලයක් ද උපදෙස් හා අමතර කොටස් විස්තර දැක්වෙන පොත් කට්ටලයක් ද සැපයිය යුතු අතර, මෙම යන්ත්‍ර ගොවිපලවලට ගෙනවිත් ක්‍රියාකරන අයුරු පෙන්වා දී භාරදිය යුතුයි.

2. අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් අකෘති පත්‍ර ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුය. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක බහා මුද්‍රා තබා අනුරාධපුර කෘෂිකර්ම (ගොවිපල් පාලන හා නිෂ්පාදන) කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නාමට එවිය යුතු අතර, ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "මහඉළුප්පල්ලම හා ගිඟුරුක්ගොඩට බිම් මට්ටම් කිරීමේ නගුල්" යන්න සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර් පත්‍ර අනු පිටපතකින් යුක්ත විය යුතු අතර, ලියාපදිංචි කළ තැපෑලෙන් විය යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් ඒවා, අනුරාධපුර, ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ, කෘෂිකර්ම නිළධාරිට අතින්ම භාරදිය යුතුයි.

4. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කළ දිනයේම ඒ ඒ ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුලත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනහොත් ඔහු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. 1970. 5. 8 දින දවල් 12 තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ, ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට රුපියල් විසිපහක (රු. 25) මුදලක් තැන්පත් කර ඇති බවට කුවිතාන්සියක් අනුරාධපුර, නව නගරයේ, ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරිට ඉදිරිපත් කළ පසුවය. මෙම තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පේරාදෙනියේ ප්‍රධාන කාර්යාලයේ හෝ කළ හැකිය. පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් නියම කරනු ලබන කාලයක් තුලදී මෙම බිම් මට්ටම් කිරීමේ නගුල් දෙක ගොවිපලවලට සැපයිය යුතුය. එසේ නොහැකි වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ද ඇතුලත් වීමට ඉඩ ඇත.

6. පිළිනොගන්නා ලද ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් නිදහස් කිරීමට අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ, පරිපාලන නිලධාරි තැන කටයුතු කරනවා ඇත.

7. නියමිත ආකෘති පත්‍රයේ ලියා නැති, නැතහොත් එකී නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති, කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් වශයෙන් සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළයුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒතැන්වල ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන තැබිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරණු ලබන මිළ ගණන් යටත් පිරිසෙයින් සති පහකටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

9 ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයේ ලියා තිබිය යුතුය.

10. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම්, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත ඉහත කී දින, එකී වේලාවේදී අනුරාධපුර කෘෂිකර්ම නිළධාරි (ගොවිපල් පාලන හා නිෂ්පාදන) ගේ කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබාගනු ලැබේ.

12. ටෙන්ඩර්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්හොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට යැව්වොත් හෝ ඔහුගේ අතටම භාරදුන්නා ලෙස සලකනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වන කෙනෙකුගේ නම සමග ඇතුලත්වූ හෝ ටෙන්ඩර් මණ්ඩලයට සැහේයයි පෙනී යන විට ටෙන්ඩර් මණ්ඩලය විසින් එකඟ නොවන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම "ලාංකික" කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වන අතර, ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරටත් එසේ බඳවා ගනු ලබන්නේ වැඩ කෙරෙන ප්‍රදේශයේ **සිටින** අය අතුරිනි.

15. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත් කරුවා කිසියම් විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද "ලාංකික" නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

16. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

17. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කරන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුලත් වේ.

18. මෙම කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූ ද කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් ඉදිරියට ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූලවද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

19. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් සහ සම්බන්ධ ඔහුගේ පොතපත, චැක්රෝල්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

20. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනත (117 පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුය.

21. මේ පිළිබඳ වැඩි විස්තර ඒ ගොවිපලවල කළමණාකරුවන්ගෙන් විමසන්න.

ඇම්. ඇල්. සී. ඉලංගකෝන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම ගොවිපල්).

1970 අප්‍රේල් මස 12 දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල් කාර්යාලයේදීය.

**4–712—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය**

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### සීතාඑළිය බීජ අර්තාපල් ගොවිපලට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර්

බණ්ඩාරවෙල කෘෂිකර්ම ගොවිපල් හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 මැයි මස 11 වැනි දින ප. ව. 2.30 දක්වා සීතාඑළිය බීජ අර්තාපල් ගොවිපළ කළමනාකාර තැන වෙත මෙහි පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|
| ගංගා වැලි කියුබ් ... ... | 125 |
| 6"×9" කළුගල් කියුබ් ... ... | 90 |
| මැටල් අඟල් 2 කියුබ් ... ... | 15 |
| මැටල් අඟල් 1 කියුබ් ... ... | 5 |
| හුණුගල් කියුබ් ... ... ... | 5 |

2. බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් ලබාගත් ෆෝරම වල ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව එවිය යුතුය. මෙම ටෙන්ඩර් ෆෝරම ලබාගැනීමට රු. 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් පරිපාලන නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් ෆෝරම ලබා ගැනීම සඳහා රු. 25 ක් තැන්පත් කිරීම පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම දිසාපති කාර්යාලයක හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ ගිණුම් අංක 37 ට හෝ කළ හැකිය.

4. ටෙන්ඩර් ෆෝරම 1970 මැයි මස 11 වෙනි දින දහවල් 12 දක්වා නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "සීතාඑළිය ගොවිපලට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම" යනුවෙන් සඳහන් කළ යුතු අතර, පහල වම් කෙළවරේ

ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. ටෙන්ඩර්පත්‍ර බණ්ඩාරවෙල ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහා ලීමට හෝ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත හෝ ඔහුගේ නියෝජිතයෙකුට අතින් ම හෝ ගෙනවිත් භාර දිය හැකිය.

6. නියමිත ෆෝරමයේ ලියා නැති හෝ නියමිත කොන්දේසි ඉටු වී නැති ටෙන්ඩර්පත්‍රයක් ටෙන්ඩර්පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ෆෝරම පැහැදිලිව තීන්තෙන් ලිවිය යුතු අතර, ටෙන්ඩර් මිළ ගණන් අකුරෙන් ද, ඉලක්කමෙන් ද ලිවිය යුතුය. ටෙන්ඩර් මිළ ගණන් වල යම් වෙනසක් කළහොත් එකී ස්ථානවල ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන තබා සහතික කළ යුතුය.

7. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දින එකී වේලාවට බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේදී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. අවශ්‍යනම් ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට එදින එම වේලාවට පැමිණ සිටිය හැක.

8. පිළිගත් ටෙන්ඩර්කරුවාට හෝ කරුවන්ට ඒ බැව් දන්වා දින 15 ක් ඇතුලත මෙම ගොඩනැගිලි ද්‍රව්‍ය සිතාඑළිය ගොවිපළ කළමනාකාර තැන වෙත ගෙන ගොස් භාර දිය යුතුය. තෝරාගත් ටෙන්ඩර් කරුවාට හෝ කරුවන්ට ඒ බැව් දන්වා දින 7 ක් ඇතුළත පිළිගනු ලැබූ වැඩ වටිනා 5% ක ප්‍රමාණයක ඇප තබා ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට නොහැකි වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ හෝ ඔවුන්ගේ නම් කොන්ත්‍රාත් කඩකළ කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් කිරීමට සිදුවනවා ඇත. ගිවිසුම්පත්‍රය සඳහා මුද්දර ගාස්තුව ටෙන්ඩර්කරු විසින් ඇටිය යුතුය.

9. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර්පත්‍ර සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේත්, යම් කිසි ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමේ සම්පූර්ණ වගකීම කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයා තබාගනී.

10. ගොඩනැගිලි ද්‍රව්‍ය සියල්ලම හෝ ඉන් කොටසක් හෝ සැපයීම සඳහා ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට හැකිය. වැඩි විස්තර සඳහා බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි තැනගෙන් විමසන්න.

එම්. එල්. සී ඉලංගකෝන්,
නි. අ. (කෘෂිකර්ම ගොවිපල්).

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය, 1970. 4. 11.

4–726—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

යොමු අංකය : 327/432.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970 මැයි 9 වෙනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | ලියා පදිංචි විය යුතු මුදල රු. ශ. |
|---|---|
| උස්ගල — සියඹලන්ගමුව මහ ගොවි ජනපදයට පිවිසෙන ප්‍රධාන මාර්ගයේ 1 වෙනි සැතපුමට ගල්දමා තාර දැමීම | 50,000.C0 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට කොන්ත්‍රාත්කරුවන් වශයෙන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති අයට 1970 මැයි මස 6 වෙනි දින දහවල් 12 වනතෙක් කුරුණෑගල දිසාපති කාර්යාලයේ දී ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් ෆෝරම අපේක්ෂකයින් විසින් කුරුණෑගල දිසාපති කායසීලයේ අදාල වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් කුරුණෑගල දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් හා විවිධසේවා සංගම්වලට අයිති සමිතිවලට ද, එක් එක් වැඩය සඳහා මුදල් ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී තිබේනම්, මෙකී වැඩ සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැකිය. ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවීමෙන් අනුමත කරන ලද සමිති නිදහස් ය. එහෙත්, ඉහත සඳහන් මුදල් ප්‍රමාණයට ලියා පදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් ෆෝරම සම්පූර්ණකර, පිටපත් දෙකකින් යුතුව ලේඛන ගත තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙලවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් ෆෝරම තැපෑලෙන් නොඑවන්නේ නම්, ගාලු මුවදොර, මහ ලේකම් කායසීලයේ, අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය.

5. 1970 මැයි මාසයේ 9 වෙනි දින පස්වරු 2.30 ට, ඉහත කී අංක 357 දරණ කාමරයේදී ටෙන්ඩර් ෆෝරම විවෘත කරනු ලැබේ.

6. තමන්ගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දැන්වූ පසු දින 10 ක් ඇතුළත ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හා ඇප තැබීමට අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් ෆෝරමය සඳහා තැන්පත් කරන ලද මුදල් රාජ්‍ය සන්තක කරනු ලැබේ.

7. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට, පුහුණු නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩ කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

8. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු කුරුණෑගල දිසාපතිගෙන් දැනගත හැකිය.

ඈස්. අමරසිංහ,
කුරුණෑගල දිසාපති වෙනුවට.

1970 අප්‍රේල් 24 වෙනි දින,
කුරුණෑගල දිසාපති කායසීලයේදීය.

4–694—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 මැයි මස 15 වැනි සිකුරාදා පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. කොළ/බටුවත්ත මහා විද්‍යාලය ... | විද්‍යාගාරය තැනීම. |
| 2. කොළ/මත්තුමගල මහා විද්‍යාලය ... | විද්‍යාගාරය තැනීම. |
| 3. කොළ/කොච්චිකඩේ මහා විද්‍යාලය ... | විද්‍යාගාරය තැනීම. |
| 4. කොළ/දෙවලපොල මහා විද්‍යාලය ... | විද්‍යාගාරය තැනීම. |
| 5. කොළ/කඹුරාගල්ල මහා විද්‍යාලය ... | විද්‍යාගාරය තැනීම. |
| 6. කොළ/මීරිගම ගුරු විද්‍යාලය ... | ගොඩනැගිලි අළුත්වැඩියාව සහ වැඩිදියුණුව. |

සංක්ෂේපය : කොළ/ = කොළඹ උතුර දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ හෝ එක් වැඩක් සඳහා රු. 100 බැගින් මුදල් තැන්පත් කර එම කුවිතාන්සිය ගම්පහ, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් පහත සඳහන් මුදල් වලට හෝ ඊට වැඩි මුදලකට හෝ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 මැයි මස 14 වැනි බ්‍රහස්පතින්දා දවල් 12 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්.) චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි

ශාඛාවෙන් හෝ ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

අවශ්‍ය ලියාපදිංචිය

අංක 1-5 දක්වා වැඩ සඳහා රු. 40,000 හෝ ඊට වැඩි ගණනකට.

අංක 6 සඳහා රු. 15,000 හෝ ඊට වැඩි ගණනකට.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර්පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ජේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර්පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර්පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර වෙත භාරදිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩර භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 මැයි මස 15 වැනි සිකුරාදා පෙ. ව. 10.30 ට ගම්පහ අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් විස්තර වෙතොත් ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකණු ලැබේ.

කේ. ඩී. ආරියදාස,
ගම්පහ ප්‍රදේශයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 අප්‍රේල් මස 17 වැනි දින,
ගම්පහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

4–800—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වාගොල්ල රජයේ ගොවිපළට වතුර පොම්ප සැපයීම

පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් වාගොල්ල රජයේ ගොවිපළට වතුර පොම්ප සැපයීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1970 මැයි මස 15 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. කරුණාකර වැඩි විස්තර සඳහා මෙම ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි දැන්වීම බලන්න.

ඇම්. ඇල්. සී. ඉලංගකෝන්,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘ. ආ. හා. ගො.)

1970 අප්‍රේල් මස 12 වැනි දින,
පේරාදෙණියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

4–715—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 7, මහාමාර්ග දෙපාර්තමේන්තුවේ, බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් කලුබෝවිල-දෙහිවල පාර පළල් කිරීම සඳහා අඟල් 4 කලුගල් සැපයීම සඳහා වූ ටෙන්ඩර් පත්, 1970 මැයි මස 15 වැනි සිකුරාදා පෙරවරු 11 වනතෙක් භාරගනු ලැබේ.

2. කොළඹ මහාමාර්ග දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘතිපත් වල ටෙන්ඩර්පත් පිළියෙළ කොට අනුපිටපතකින් ද යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගතහැකිවන අතර සැලැස්මද ඔහුගේ කාර්යාලයෙන් බලාගැනීමට පුලුවන.

3. රු. 25,000 නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත්කර ලබාගත් කුවිතාන්සිය 1970 මැයි මස 8 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසු වෙනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාදවී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 ක් බැගින් ආපසු නොගෙවන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරිතැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ, පහළ චැතැම් වීදියේ පිහිටි මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළහැක.

එස්. පත්මනාදන්,
අධිකාරි ඉංජිනේරු, බටහිර කොට්ඨාශය,
(මහාමාර්ග)

මහාමාර්ග දෙපාර්තමේන්තුව,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7.
1970 අප්‍රේල් 16.

4–756—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය—ටෙන්ඩර් දැන්වීම

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ඉංජිනේරු ආයුධ සැපයීම සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍රිකා 1970 මැයි මස 25 වෙනි දින පෙරවරු 10 වන තෙක් දේශීය සපයන්නන් ගෙන් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා නියමිත ලෙස ලියා අනුපිටපතකින්ද යුතුව එවිය යුතුයි. ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ අංක 200 ස්ථානයෙහි වූ මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත මුදලින් රු. 100 ක මුදලක් තැන්පත් කර ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සිය මාගේ කාර්යාලය වෙත 1970 මැයි මස 24 වෙනි දින පෙරවරු 12 ට පෙර ඉදිරිපත් කළ විටය. වැඩි විස්තර මාගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

200, කිරුළ පාර,
කොළඹ 5.

4–674—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

මහාමාර්ග දෙපාර්තමේන්තු ගාලුවත දිස්ත්‍රික්කයේ සෙන්ගල් ඔය පාලමට 58/4 කොළඹ-පුත්තලම පාර. 3/4" කළුගල් කියුබ් 110ක් ද, 2" කළුගල් කියුබ් 180ක් සහ 6"-9" සක්කගල් කියුබ් 20ක් සැපයීම හා භාරදීම සඳහා ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ. ටෙන්ඩර් භාරගනු ලබන්නේ 1970.5.16 වෙනි සෙනසුරාදා පෙරවරු 11 තෙක් කොළඹ 1, මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසිනි.

2. රත්මලානේ ම. මා. දෙ. පාලම් පිළිබඳ ප්‍රධාන ඉන්ජිනේරු කාර්යාලයෙන් ලබාගත් ටෙන්ඩර් පිළිබඳ ඉල්ලුම්පත්‍ර පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් සියළු විස්තර ලබා ගත හැක.

3. ටෙන්ඩර්පත් නිකුත් කරන්නේ ටෙන්ඩර්කරුවන් විසින් රු. 200ක මුදල් තැන්පත් කර ඒ පිළිබඳ කුවිතාන්සියක් 70.5.10 වෙනි ඉරිදා පස්වරු 4.30 ට පෙර පාලම් පිළිබඳ ප්‍රධාන ඉන්ජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විටයි. දිනකට හෝ ඉන් කොටසකට රු. 10 බැගින් ආපසු නොගෙවනු ලබන ප්‍රමාද ගාස්තුවක් වශයෙන් නිකුත් කරන නිලධාරියාට ගෙවා, ඊටපසු කුවිතාන්සිය ලබාගෙන ඒ අනුව ප්‍රමාද වූ ඉල්ලුම්කරුවන් විසින් ටෙන්ඩර් පිළිබඳ ඉල්ලුම් පත් ලබා ගතහැක.

4. ටෙන්ඩර් වෙනුවෙන් මුදල් තැන්පත් කළ හැක්කේ කොළඹ කොටුවේ ම. මා. දෙ. ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියකදීය.

ඇම්. චන්ද්‍රසේන,
පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු.

පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය,
මහාමාර්ග දෙපාර්තමේන්තුව,
රත්මලාන.

4–671—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

මහාමාර්ග දෙපාර්තමේන්තු රත්නපුර දිස්ත්‍රික්කයේ වරකාතොට පාලමට 64/8 කොළඹ-රත්නපුර-වැල්ලවාය පාර. 3/4" කළුගල් කියුබ් 400ක් ද, 2" කළුගල් කියුබ් 700ක් සහ 6"-9" සක්කගල් කියුබ් 350ක් සැපයීම හා භාරදීම සඳහා ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ. ටෙන්ඩර් භාරගනු ලබන්නේ 1970.5.16 වෙනි සෙනසුරාදා පෙරවරු 11 තෙක් කොළඹ 1, මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසිනි.

2. රත්මලානේ ම. මා. දෙ. පාලම් පිළිබඳ ප්‍රධාන ඉන්ජිනේරු කාර්යාලයෙන් ලබාගත් ටෙන්ඩර් පිළිබඳ ඉල්ලුම්පත්‍ර පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් සියළු විස්තර ලබා ගත හැක.

3. ටෙන්ඩර්පත් නිකුත් කරන්නේ ටෙන්ඩර්කරුවන් විසින් රු. 200ක මුදල් තැන්පත් කර ඒ පිළිබඳ කුවිතාන්සියක් 70.5.10 වෙනි ඉරිදා පස්වරු 4.30ට පෙර පාලම් පිළිබඳ ප්‍රධාන ඉන්ජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විටයි. දිනකට හෝ ඉන් කොටසකට රු. 10 බැගින් ආපසු නොගෙවනු ලබන ප්‍රමාද ගාස්තුවක් වශයෙන් නිකුත් කරන නිලධාරියාට ගෙවා, ඊටපසු කුවිතාන්සිය ලබාගෙන ඒ අනුව ප්‍රමාද වූ ඉල්ලුම්කරුවන් විසින් ටෙන්ඩර් පිළිබඳ ඉල්ලුම් පත් ලබා ගතහැක.

4. ටෙන්ඩර් වෙනුවෙන් මුදල් තැන්පත් කළ හැක්කේ කොළඹ කොටුවේ ම. මා. දෙ. ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියකදීය.

ඇම්. චන්ද්‍රසේන,
පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු.

පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය,
මහාමාර්ග දෙපාර්තමේන්තුව,
රත්මලාන.

4–672—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

